# Extimacy යනු කුමක් ද?

මනෝවිශ්ලේෂණ න්‍යාය තුළ extimite නමැති ප්‍රංශ වචනය මුලින් ම භාවිතා වන බව දැකිය හැක්කේ ජැක්ස් ලැකාන්ගේ VII වන සම්මන්ත්‍රණයේ දී ය. එම ප්‍රංශ වචනය ඉංග්‍රීසි භාෂාවට පරිවර්තනය කර ඇත්තේ extimacy යනුවෙනි. ජැක්ස් ඇලෙන් මිලර්ගේ සිට ස්ලැවෝ ජිජැක් ඇතුළු විවිධ චින්තකයින් විසින් මෙම extimacy නමැති මනෝවිශ්ලේෂණ අදහස විවිධ මාන ඔස්සේ විග්‍රහ කර ඇත. ජැක්ස් ලැකාන්ගේ මූලික විග්‍රහයට අනුව extimacy යනු “intimate exterior“ නමැති අදහස යි. එය ඉතා සරල ලෙස “කුළුපග බාහිරත්වයක්“ යනුවෙන් සිංහල භාෂාවට පරිවර්තනය කළ හැක. නමුත් extimite නමැති මනෝවිශ්ලේෂණ අදහස එතරම් සරල සිංහල අර්ථයකට ලඝු කළ නො හැකි බව ඒ පිළිබඳ වැඩි දුර අධ්‍යයනය කළ විට පෙනී යයි. මන්ද යත් ලැකාන් එම අදහස වර්ධනය කරමින් සඳහන් කරන්නේ අපට වඩාත් කිට්ටු ම දේ එක ම විට අපට වඩාත් දුරස්ථ ද වන බව යි. නමුත් ආත්මයට වඩා සමීප මෙම විසර්ජක බාහිරත්වය (ejaculatory exterior) ආත්මය තේරුම් ගන්නේ බාහිර දෙයක් ලෙස ය. ඒ අනුව ආත්මයට ඉතා ගැඹුරු ම සමීපතාවය (deepest intimacy) ආත්මයට පිළිඹිබු වන්නේ බාහිරත්වයක් තුළ ය. ජැක්ස් ඇලෙන් මිලර්ට අනුව interior නමැති ඉංග්‍රීසි වචනය ලතින් භාෂාවෙන් ඉංග්‍රීසි භාෂාවට එක් වූ සාපේක්ෂ අදහසක් දනවන පදයක් වන අතර intimus යනු ඉතා උසස් ම තත්ත්වය (superlative) පිළිබඳ අදහසක් දනවන පදයකි. මෙම පදය, අභ්‍යන්තරයේ පවතින ගැඹුරු ම ස්ථානය යන අරුත දැනවීමට දරන උත්සාහයක් ලෙස ඔහු සලකයි. මෙම intimacy යන වචනයේ ආත්මයේ තහනම් කලාපය යන අරුත ද පවතියි. තව ද extimacy නමැති ලැකානියානු මනෝවිශ්ලේෂණ අදහස මඟින් අභ්‍යන්තරය හා බාහිරය අතර සම්බන්ධතාවය අර්බුදයට ලක් කරයි. එය පිටත (යමක සීමාව) හා ඇතුළත (එහි මධ්‍යය) එක ම තලයක් බවට පත් කරයි. එමෙන් ම මෙමඟින් ආත්මය හා වාස්තවික යථාර්ථය පිළිබඳ පවතින අදහස ද ප්‍රශ්න කරයි.

extimite නමැති ප්‍රංශ වචනය සඳහා extimacy, ex-timacy යනුවෙන් ඉංග්‍රීසි නාම පද හා ඊට අනුබද්ධ ක්‍රියා පද ලෙස extimate, ex-timate යන පද මනෝවිශ්ලේෂණය සම්බන්ධ ලිපි තුළ සඳහන් වේ. මෙම ලැකානියානු මනෝවිශ්ලේෂණ අදහස සන්නිවේදනය කිරීම සඳහා අප එම අදහස හැඟවෙන සිංහල පදයක් සකසා ගත යුතු ය. ඒ පිළිබඳ සොයා බැලීමේ දී මෙම ලියුම්කරුට එම අදහස දැක්වෙන සිංහල වචන තුනක් “ත්‍රිමාණ“ වෙබ් අඩවිය තුළින් ම සොයා ගත හැකි විය. ඉන් එකක් වන්නේ මහේෂ් හපුගොඩ විසින් සකස් කරන ලද “බහිසංසේවනය“ නමැති පදය යි. අනෙක් පද වන්නේ දීප්ති කුමාර ගුණරත්න විසින් සකස් කරන ලද “බහිසන්ථවය“ හා මෙම ලියුම්කරු විසින් සකස් කරන ලද “බහිසංස්ලේෂණය“ නමැති පද යි. නමුත් මෙම ලැකානියානු අදහස පිළිබඳ විධිමත් අධ්‍යයනයක් සිදු කළ විට ඉහත සිංහල පද තුනෙන් ම එම ප්‍රංශ පදයෙහි ඇතුළත් මනෝවිශ්ලේෂණාත්මක අදහසෙහි අර්ථය නිසි ලෙස පැහැදිලි නො වන බව අනාවරණය විය. එබැවින් extimite නමැති ලැකානියානු අදහස සමඟ එම කිසිඳු වචනයක් නිවැරදි ව තුලාය කළ නො හැකි බව පැහැදිලි විය. extimite හි සිංහල අර්ථය පිළිබඳ ව යම් විස්තරාත්මක පැහැදිලි කිරීමක් අන්තර්ගත වන්නේ “ත්‍රිමාණ“ වෙබ් අඩවියේ ම පළ වූ

මහේෂ් හපුගොඩ රචනා කළ “Everest: ෆැන්ටසිය තරණය කිරීමට පෙර“ නමැති ලිපියේ ය. එම ලිපියේ extimacy නමැති අදහස පිළිබඳ ඔහු මෙසේ සඳහන් කරයි. “බහිසංසේවනය යන්න ex-timacy යන ලැකානියානු වචනයේ පරිවර්තනය වන අතර එය ඉංග්‍රීසියෙන් external හා intimacy යන වචන දෙකේ එකමුතුවෙන් සෑදී ඇත. (external = බාහිර/පිටස්තර) සහ intimacy (ඇහැලුම්කම/සංසේවනය).“

එහි දී ඔහු බහිසංසේවනය යනු ex-timacy නමැති ලැකානියානු වචනයේ පරිවර්තනය යැයි සඳහන් කළ ද ඒ පිළිබඳ මූලාශ්‍රයක් සඳහන් නො කරන බැවින් ද එම වාක්‍යයේ ම අවසානයේ සිංහල පරිවර්තනය ඔහු විසින් ම පහදා දෙන බැවින් එම සිංහල වචනය ඔහුගේ ම ව්‍යුත්පන්නයක් යැයි අනුමාන කළ හැකි ය. නමුත් exteriority (exterieur - ප්‍රංශ වචනය) හා intimacy (intimite - ප්‍රංශ වචනය) යන වචන දෙකෙහි exterieur (exteriority) හි “ex“ නමැති උපසර්ගය (prefix) සමඟ intimite (intimacy) යන පදය යෙදීමෙන් extimite (extimacy) යන පදය බිහි වී ඇති ආකාරය දක්නට ලැබේ. එබැවින් එයට අදාළ ව සිංහල පදය ගොඩ නැංවීමේ දී හපුගොඩ කරනු ලබන පැහැදිලි කිරීමේ දෝෂ සහගත බවක් ද නිරීක්ෂණය කළ හැකි විය.

external = බාහිර/පිටස්තර ලෙස හපුගොඩ කරනු ලැබ ඇති පරිවර්තනය ඉංග්‍රීසි-සිංහල ශබ්දකෝෂ අනුව පිළිගත හැකි වුව ද intimacy ඇහැලුම්කම/සංසේවනය යන පරිවර්තනයේ යම් දෝෂයක් පවතියි. මලලසේකර ඉංග්‍රීසි-සිංහල ශබ්දකෝෂය, සුචරිත ගම්ලත් ඉංගිරිසි-සිංහල මහා ශබ්දකෝෂය හා Carter's සිංහල-ඉංග්‍රීසි අකාරාදිය ආදී ශබ්දකෝෂ අනුව ඇහැලුම්කම යන සිංහල වචනය සඳහා intimacy යන වචනය යෝජනා කර ඇති වුව ද intimacy යන පදය සඳහා සංසේවනය යන පදය ඒ කිසිදු ශබ්දකෝෂයක සඳහන් නො වේ. එමෙන්ම හරිශ්චන්ද්‍ර විජේතුංග සම්පාදනය කළ ගුණසේන මහා සිංහල ශබ්ද කෝෂයට අනුව සංසේවනය නමැති වචනය සඳහා ලබා දී ඇති අර්ථය වන්නේ “ලිංගික ව වෙනස් වූ ජන්මාණු දෙකක් යුක්තාණුවක් ඇති කරමින් එක් වීම“ යන්න යි. ඒ අනුව හපුගොඩ දක්වා ඇති සංසේවනය යන වචනය intimacy නමැති ඉංග්‍රීසි වචනය සඳහා නිවැරදි සිංහල පරිවර්තනයක් ලෙස සැලකිය නො හැක. නමුත් අන්තර්ජාලයට ඇතුළත් කර ඇති මධුර ඉංග්‍රීසි-සිංහල ශබ්දකෝෂයට අනුව intimacy නැමති වචනය සඳහා ඇහැලුම්කම, ඉතා කිට්ටු ආශ්‍රය, දැඩි මිත්‍රත්වය හා සංසේවනය යන සිංහල පද යෝජනා කර ඇත. භාෂා විශාරදයෙකු නො වන මධුර ශබ්දකෝෂයේ නිර්මාතෘවරයා තොරතුරු තාක්ෂණ ඉංජිනේරුවකු වන බැවින් ඔහුට සිංහල භාෂාවේ භාවිතා වන **“සංසේවනය“** නමැති වචනය **“සංසේවනය“** යනුවෙන් පරිගණක අකුරු ලියනය කරන විට අත්වැරදීමක් වූවා විය හැකි ය. මන්ද යත් ගුණසේන මහා සිංහල ශබ්ද කෝෂයට අනුව සංසේවනය යනු “ඇසුරු කිරීම“, “එක්ව විසීම“ යන අරුත් දෙයි. කාටර් සිංහල-ඉංග්‍රීසි අකාරාදිය අනුව සංසේවනය යන සිංහල පදය සඳහා intimacy යන ඉංග්‍රීසි පදය යෙදෙයි. එබැවින් extimacy නමැති ලැකානියානු මනෝවිශ්ලේෂණ අදහස දනවන සිංහල පදය ලෙස බහිසංසේවනය ලෙස හපුගොඩ කරනු ලබන පැහැදිලි කිරීම නිවැරදි නො වේ.

මේ අනුව extimacy යන පදය සඳහා නිවැරදි සිංහල පදයක් සකසා ගත යුතු ව ඇත. නමුත් extimacy

නමැති මනෝවිශ්ලේෂණ සංකල්පය විමසීමේ දී එහි අදහස නිවැරදි ව සන්නිවේදනය කළ හැකි සිංහල පදයක් තැනීම ඉතාමත් දුෂ්කර බව පෙනේ. මලලසේකර ඉංග්‍රීසි-සිංහල ශබ්දකෝෂය, සුචරිත ගම්ලත් ඉංගිරිසි-සිංහල මහා ශබ්දකෝෂය, Carter's ඉංග්‍රීසි-සිංහල අකාරාදිය හා ගුණසේන මහා සිංහල ශබ්ද කෝෂය නමැති ශබ්දකෝෂ භාවිතා කිරීමෙන් intimacy නැමති වචනය සඳහා මනෝවිශ්ලේෂණ අර්ථයට ගැලපෙන පදයක් සොයා ගැනීමට මෙම ලියුම්කරු උත්සාහ කළ අතර එහි දී එම මනෝවිශ්ලේෂණ සංකල්පය මඟින් ආත්මයේ ඉතා අභ්‍යන්තරීය, ආත්මයට පවා ආගන්තුක අභ්‍යන්තරය යන අදහස නිරූපණය වන නිසා “ආධ්‍යාත්මික“ හෝ “ආත්මීය“ යන සිංහල වචන ඒ සඳහා ආසන්න වශයෙන් ගැලපෙන බව මෙම ලියුම්කරුගේ විශ්වාසය යි. එහෙත් ආධ්‍යාත්මික නමැති පදය මඟින් දාර්ශනික අදහසක් ද ජනිත වන බැවින් ආත්මීය යන වචනයට සම්බන්ධ ආත්මික (ආත්මය පිළිබඳ වූ, තමා සතු, තමාගේ යන අදහස් එමඟින් ලබා දෙයි.) යන පදය intimacy නැමති වචනය සඳහා සුදුසු යැයි යෝජනා කළ හැක. නමුත් භාෂාවිද්‍යාව සහ මනෝවිශ්ලේෂණ සංකල්පවල දියුණුව ද අනුව ඉදිරියේ දී මෙයට වඩාත් ගැලපෙන සිංහල වචනයක් සොයා ගැනීමේ හැකියාවක් පවතින බව ද මෙහි දී සඳහන් කළ යුතු ය. එබැවින් extimacy නමැති පදය exteriority හා intimacy යන පද දෙක ඇසුරින් ව්‍යුත්පන්න වී ඇති නිසා දැනට exteriority යන පදය සඳහා බාහිරත්වය, බාහ්‍යත්වය යන පදවලින් “බහි“ යන්න ද intimacy යන පදය සඳහා “ආත්මික“ යන පදය ද යෙදීමෙන් “බහිආත්මික“ යන සිංහල පදය අපට ව්‍යුත්පන්න කර ගත හැකි ය.

ප්‍රංශුවා කෙනීට අනුව intimacy යන ඉංග්‍රීසි වචනය මඟින් intimite නමැති ප්‍රංශ වචනයේ පූර්ණ අර්ථය ලබා නො දෙයි. ප්‍රංශ intimite වචනය මඟින් කුළුපගතාවය මෙන්ම සත්තාවේ ගැඹුරු ඉතා අභ්‍යන්තරිකතාවයක් පිළිබඳ අදහස ද ඇතුළත් වේ. එබැවින් ඔහු ඒ සඳහා intimacy යන වචනය වෙනුවට intimateness නමැති ඉංග්‍රීසි වචනය වඩාත් යෝග්‍ය විය හැකි බවට යෝජනා කරයි. ඒ අනුව extimacy සඳහා අදාළ සිංහල පදය “බහිආත්මිකතාවය“ යනුවෙන් අපට සම්පාදනය කර ගත හැකි ය.

ආත්මයේ මදයට සම්බන්ධ මෙම බහිආත්මිකතාවය ලැකාන් සම්බන්ධ කරන්නේ දෙය (the Thing) හා වස්තුව (objet a) සමඟ ය. ඔහුට අනුව දෙය යනු බාහිරකරණය කරන ලද අභ්‍යන්තරිකත්වයකි. නිදසුනකට ළදරුවාට වස්තුව වන්නේ මවගේ සැබෑ පියයුරුව නො ව ඔහුට අතිමහත් ප්‍රමෝදය ලබා දුන් පියයුරුවේ ප්‍රතිමූර්තියකි. එවිට එය දරුවාගෙන් බාහිර යමක් නො ව බහිආත්මික යමක් බවට පත් වේ. එවිට සත්තාවේ සමරූපය ලෙස බහිආත්මික වස්තුව සත්තාවේ ව්‍යුහය තුළ අන්තර්ගත වී ඇත්තේ අත්පත් කර ගත නො හැකි වස්තුවක් ලෙස ය. ආත්මයේ අභ්‍යන්තරයට අනුව තම ප්‍රථම පිටත (outside) ලෙස මෙම බහිආත්මිකතාවය සැලකේ. ලැකාන් සඳහන් කරන්නේ අපට වඩාත් ම සමීප දෙය කෙසේ වෙතත් අපෙන් බාහිර ව පිහිටන බව ය. එබැවින් මෙම බහිආත්මිකතාවය යථාර්ථයේ දී බාහිර ලෝකය තුළ පිහිටන යමක් නො වේ. මෙම දෙය කාලයට අනුව ආත්මයේ බාහිරත්වය තුළ පිහිටන අතර අවකාශ ම ය ලෙස ආත්මයේ නො වෙනස් ලක්ෂ්‍යය ලෙස අභ්‍යන්තරික ව පිහිටයි. ආත්මය හා වස්තුව අතර අවකාශ ම ය සම්බන්ධතාවය පාරභෞතික ක්ෂේත්‍රය මත පාදක වී ඇත. ආත්මය හා වස්තුව අතර මෙම පාරභෞතික සම්බන්ධතාවය “කුමක් ද යන්න“ හා “කුමක් ද යන්නෙන් පිටත“ අතර වෙනස මත

තීරණය වේ. මෙයට අනුව වස්තුව යනු ආත්මයට පිටතින් පවතින දෙය වේ. නමුත් මනෝවිශ්ලේෂණය හඳුන්වාදීමත් සමඟ මනෝවිශ්ලේෂණය තුළ භාවිතා වන වස්තුව නමැති අදහස සමඟ ඉහත පාරභෞතික අදහස අර්බුදයට යයි. ලැකානියානු අදහස අනුව බහිආත්මිකතාවය නමැති වචනය මඟින් බාහිර හා ඇතුළත අතර වෙනස ගැටලු සහගත කරවයි. එවිට සැබැවින් ම ලැකානියානු බහිආත්මිකතාවය යන අදහස මඟින් වාච්‍යාර්ථය, සංකල්පය පමණක් නො ව වස්තුව සම්බන්ධ අවකාශ ම ය ස්වභාවය ද ප්‍රතිඅර්ථ ගැන් වේ.

ජැක්ස් ඇලෙන් මිලර් මෙම බහිආත්මිකතාවය (extimacy) යන ලැකානියානු අදහස වැඩි දියුණු කරන්නා ය. ඔහු එම අදහස සම්බන්ධ කරන්නේ අනෙකා සමඟ ය. එය පරපෝෂිත ආගන්තුක ශරීරයක් ලෙස ඔහු අර්ථ ගන්වයි. ඔහුට අනුව දෙවියන් යනු ද එවැනි බහිආත්මික දෙයකි. ඔහු ඉන් සඳහන් කරන්නේ දෙවියන් පවතින්නේ අපගේ අභ්‍යන්තරය තුළ ම පවතින අභ්‍යන්තර ස්ථානයක බව ය. එනම්, එය අපගේ අභ්‍යන්තරය තුළ පවතින බාහිරත්වයට සමීපස්ථානයක පිහිටයි. ඒ අනුව ලැකාන් බාහිරත්වය තුළ අභ්‍යන්තරයේ පිළිබිඹුව පවතින බව අදහස් කරන විට ඇලෙන් මිලර් බාහිරත්වයේ පිළිබිඹුව අභ්‍යන්තරය තුළ පවතින්නේ ය යන අදහස ලබා දෙයි. එම අදහස් දෙක ප්‍රතිවිරුද්ධ අදහස් නො ව එක ම අදහසෙහි මාන දෙකකි. මන්ද යත් එම අදහස් දෙකෙන් ම හෙළිදරවු වන්නේ ආත්මයේ අභ්‍යන්තරය තුළ පවතින ඉන් පිටතට පැමිණි යමක් වීම නිසා ය.

ජැක්ස් ඇලෙන් මිලර්ගේ පැහැදිලි කිරීම පහත සරල 1 වන රූප සටහන මඟින් වටහා ගත හැකි ය. එනම්, ඉතා ම කුළුපග/සමීප/ආත්මික දේ ආත්මයේ අභ්‍යන්තරය තුළ බාහිරත්වයක් ලෙස පවතින ආකාරය එමඟින් දැක් වේ.




1 වන රූප සටහන

පිටත වෘත්තයට ඇතුළතින් අඳුරු කර ඇති වෘත්තය යනු එම බාහිර යැයි අප හඳුනා ගන්නා එහෙත් ඉතා ම කුළුපග, සමීප, ආත්මික දේ ය. සායනික මානයෙන් ගත් විට මෙම අභ්‍යන්තරිකතාවයේ පවතින්නේ බාහිරත්වයකි. එහි දී වඩාත් ම කුළුපග, අභ්‍යන්තර දේ එක විට ම වඩාත් ම සැඟ වී පවතියි යන අදහස ද ලබා දෙයි. එවිට වඩාත් කුළුපග ආත්මික දේ යනු විනිවිද පෙනෙන යමක් නො ව පාරාන්ධ ස්ථානයකි. එවිට extimacy යනු intimacy යන්නෙහි විරුද්ධාර්ථය ද නො වේ.

ඉහත 1 වන රූප සටහන ආත්මය සහ අනෙකාට අදාළ ව චිත්‍රණය කළ විට පහත පරිදි වේ.




දෙවන රූප සටහන

මෙහි දී ආත්මයට අදාළ වෘත්තය තුළ ආත්මයේ ඉතා අභ්‍යන්තර හෙවත් බහිආත්මික අනෙකා අන්තර්ගත වී පවතියි. ලැකාන් ට අනුව ද මෙම අනෙකා යනු මටත් වඩා මා ඇලී සිටින මා වඩාත් උසි ගන්වන කෙනෙකි. එවිට ජාතිවාදය තුළ යුදෙව්වා හා මුසල්මානුවා යනු ආත්මය තුළ පිහිටා සිටින අභ්‍යන්තරිකභාවයක් බව වැටහී යා යුතු ය. එමෙන් ම මෙම රූපය අප වඩාත් සංකීර්ණ කළ විට අනෙකා සහ වස්තුව අතර සම්බන්ධතාවය හඳුනා ගත හැකි වනු ඇත. එය පහත තුන්වන රූප සටහනෙන් දැක් වේ.




තුන්වන රූප සටහන

මෙම රූපය ඉහත දෙවන රූපයේ ම දිගුවකි. බාහිර වෘත්තය අනෙකා ලෙස අප චිත්‍රණය කළ විට එහි මධ්‍ය තුළ අපගේ බහිආත්මිකතාවය පිහිටයි. එය අත්පත් කර ගෙන සිටින්නේ ලැකානියානු කුඩා වස්තුව හෙවත් object a ය. එනම්, අනෙකා තුළ වස්තුව අන්තර්ගත ව ඇත. ඉන් අනෙකා ක්‍රියාකාරී නො වන්නේ ය යන අදහස ලබා නො දෙන අතර ඉන් ලබා දෙන්නේ අනෙකා පැවතීමකින් තොර ව a (වස්තුව) නිසා ක්‍රියාකාරී වේ යන්න යි. එවිට ජාතිවාදය තුළ මුසල්මානුවා (අනෙකා) පවතින්නේ මා සිතන විට ය.

ජැක්ස් ඇලෙන් මිලර්ට අනුව බහිආත්මිකතාවය සඳහා ඉතා සරල සංකේතය A---->a ලෙස හැඳින්විය හැක. මෙහි A යනු සංකේතීය පිළිවෙළ ද a යනු වස්තුව ද වේ. නමුත් මෙහි විශේෂත්වය වන්නේ මෙම a යනු හැඟවුම්කරණය කළ නො හැකි විෂමජාතීය අවයවයක් වීම යි. සෑම දෙයක් ම ව්‍යුහගත වුවත් සෑම දෙයක් ම හැඟවුම්කරණය කළ නො හැකි යැයි ලැකාන් පවසන්නේ මේ නිසා ය. එය අපට A <>

a ලෙස ද ලිවිය හැකි ය. ඒ අනුව A සහ a අතර පවතින දියමන්තිය (<>) මඟින් එකක් අනෙකට බාහිරත් නො වන අභ්‍යන්තරත් නො වන යන අදහස ලබා දෙයි. එමඟින් බාහිර හා අභ්‍යන්තර අතර පවතින විරුද්ධතාවය ඉක්මවා යාමක් සිදු වේ. එය ප්‍රත්‍යාවර්ත ය. මෙහි A යනු අනෙකා යයි අදහස් කළ විට මෙම අනෙකා අපගේ මධ්‍ය තුළ ම පිහිටන යමක් බවට පත් වන අතර එම අනෙකා අපට වටහා ගත නො හැකි යමක් (a) මඟින් පිර වී පවතින්නේ ය යන අදහස ද ලබා දෙයි. ලැකාන් ට අනුව මෙම අනෙකා යනු මටත් වඩා මා වඩාත් බැඳුණු කෙනෙකි. එවිට ජාතිවාදය පදනම් වන්නේ මෙම තර්කනය මත ය. එහි දී අප ජාතිවාදය වටහා ගත යුත්තේ මගේ ම විනෝදය මට ම පිළිකුල් සහගත බැවින් මගේ එම විනෝදයට මා වෛර කිරීමක් ලෙස ය. එනම්, අනෙකා සිටින්නේ මගේ බහිආත්මිකතාවය තුළ නම් අනෙකා සම්බන්ධ විනෝදය මෙන් ම වෛරය ද මගේ ම ගොඩ නැංවීමකි. එනම්, විනෝදය සඳහා අනෙකාගේ මැදිහත්වීම අවශ්‍ය වන අතර ම අනෙකා නො මැති ව අපට විනෝද වීමට ද නො හැකි ය. සරළ ව මෙම අනෙකා යනු අප තුළ සිට බහිෂ්කරණය වූ අනෙකෙකු වේ.

එබැවින් ලැකානියානු මනෝවිශ්ලේෂණය තුළ භාවිතා වන විනෝදය නමැති සංකල්පය පවතින්නේ ද මෙම දෙය හෙවත් බහිආත්මිකතාවය තුළ ය යන්න වැටහී යා යුතු ය. වෙනත් ආකාරයකින් සඳහන් කරන්නේ නම් විනෝදය යනු ලබා ගත නො හැකි දෙය අපගේ එදිනෙදා ජීවිතයේ නැවත අප කරා පැමිණීමකි. මෙය මුසල්මානුවන්ට සම්බන්ධ කළ විට නැවත මා කරා පැමිණෙන මාගෙන් බැහැර ව ගිය මගේ සාරය මගේ ද එසේත් නැත්නම් මුසල්මානුවාගේ ද යන උභතෝකෝටික ගැටළුවට මා මුහුණ දෙයි. එබැවින් මෙම බහිආත්මිකතාවයට අවකාශමය මානයක් ද පවතින්නේ ය යන අදහස පැහැදිලි විය යුතු ය.

ඇලෙන්කා සුපැන්ජිත්ට අනුව මෙම බහිආත්මිකතාවය යනු තමාට වඩාත් අන්තරස්ථ යමක් තමාගෙන් වඩාත් විදේශික හා බාහිර දෙයක් සමඟ සමපාත වීමකි. එනම්, එය තමාට අයත් හෝ තමාට ඉතා විදේශික හා පිළිකුල ඇති කරවන යමකි. ස්ලැවෝ ජිජැක් මේ පිළිබඳ දක්වා ඇති සරල උදාහරණය නම්, ඔබ පිරිසිදු වීදුරුවක් මතට කෙළ ගැසුවා යැයි සිතන්න. දැන්, නැවත එම කෙළ පිඩ ඔබ ම යළි උරා බීම කොතරම් අසීරු පිළිකුල් සහගත දෙයක් වන්නේ ද? එනම්, යම් මොහොතකට පෙර තමාගේ කොටසක් බවට පත් ව තිබූ පිරිසිදු යමක් පිළිකුල් සහගත යමක් බවට පරිවර්තනය වීමකි. බහිආත්මිකතාවය යනු ද එවැන්නකි.

ම්ලාදන් දොලාර්ට අනුව ෆ්‍රොයිඩියානු uncanny (ගුප්ත, දුරවබෝධ) යන වචනය තුළ ද එක ම විට සැඟවුණු, රහස්මය යන අදහස සමඟ තර්ජනාත්මක, අසහනකාරී යන අදහස් ද අන්තර්ගත ව පවතියි. එහි දී අර්ථ දෙකක් ඍජු ව ම සමපාත වී හඳුනා ගත නො හැකි මට්ටමට පත් වී තිබේ. ඒ අනුව ම්ලාදන් දොලාර්ට අනුව එම තත්ත්වය සඳහා ලැකානියානු මනෝවිශ්ලේෂණයට අනුව ගැලපෙන ඉංග්‍රීසි පදය extimacy යන්න ය.

ස්ලැවෝ ජිජැක්ට අනුව සංකේතීය පිළිවෙළ සමස්ථිතිමය තුලනයකට උත්සාහ කළ ද එහි මධ්‍යය තුළ සංකේතනය කළ නො හැකි, සංකේත පිළිවෙළට බද්ධ කළ නො හැකි ආගන්තුක යමක් පවතියි. ඔහු

එය දෙය (the Thing) ලෙස නම් කරයි. ජිජැක්ට අනුව ලැකානියානු බහිආත්මිකතාවය යනු එය යි. එය මා තුළ පවතින මට වඩා දෙය ය. වෙනත් අයුරකින් සඳහන් කරන්නේ නම් එය ආත්මය සංස්ථාපනය කරවන ආත්මය තුළ පවතින වස්තුව ය. ජැක්ස් ඇලෙන් මිලර්ට අනුව මෙහි විශේෂත්වය වන්නේ මෙම වස්තුව ආත්මය සමඟ නො පෑහෙන බවක් පවතින බවට ඇති වන හැඟීම ය. එය ආත්මය නියෝජනය කරන භෞතික ශරීරය අතුරුදන් වීමක් හා සමාන ය. එය එක් අතකින් සංකේතකරණය කළ නො හැකි ආත්මය තුළ පවතින ශේෂයකි, මණ්ඩියකි. ජිජැක් මෙම බහිආත්මිකතාවය යථෙහි කුඩා කැබැල්ලක් ලෙස ද නම් කරයි.

ආත්මය හා බහිආත්මිකතාවය අතර සබඳතාවය ජිජැක් ෆැන්ටසි සමීකරණය වන $<>a සමඟ ද තුලනය කරයි. මන්ද යත් බෙදුණු ආත්මය සංස්ථාපනය කරන සංකේතීය රාමුවට ධාරණය කර ගත නො හැකි ව ශේෂ වන යථ ම ය කොටස ලැකානියානු object a ලෙස හඳුන්වා දිය හැකි බැවිනි. එය ආත්මය සංස්ථාපනය කරනු ලබන ආත්මය තුළ පවතින වස්තුව වේ. එවිට මෙම a මඟින් බෙදුණු ආත්මයෙහි හිදැස පුරවයි. ෆැන්ටසි සමීකරණයට අනුව එය ප්‍රත්‍යාවර්ත (<>) වේ. ඒ අනුව ආකර්ෂණය කරන "වස්තුවක්" හා විකර්ෂණය කරන "දෙයක්" ලෙස ආත්මය අභ්‍යන්තරයෙන් දෙපළු වී පවතියි. ජිජැක්ට අනුව ආත්මය යනු සාරාත්මක දෙයක් නො වේ. එය සිය අභ්‍යන්තරික ලෝකයේ අපරූපී, කෲර ලෙස හැඟෙන වස්තුව සමඟ යම් දුරක් නඩත්තු කරයි. නමුත්, අප මෙහි දී වටහා ගත යුත්තේ මෙම අපරූපියා යනු ආත්මය ම බව ය. ඉහතින් සඳහන් කළ දෙය යනුවෙන් සලකන්නේ ද මෙය යි. මෙම දෙය ආත්මය ක්‍රියා කරවයි, පදවයි. මෙම දෙය ආත්මය මධ්‍යයෙහි පවතින්නේ එය බැහැර කර ඇති බවට වන හැඟීම පවතින විට පමණි. එනම්, යථාර්ථය තුළ මෙම දෙය සැම විට ම ආගන්තුක බාහිර දෙයක් ලෙස ඉදිරිපත් විය යුතු ය. ඒ අනුව ඉහත ෆැන්ටසි සමීකරණයේ විරුද්ධාභාසය අපට තවත් මානයකින් වටහා ගත හැකි ය. මෙහි දී $<>a යනුවෙන් සඳහන් වන විට \$ හා a යනුවෙන් සඳහන් වන්නේ වස්තු දෙකක් නො ව එක ම වස්තුවේ ම පැති දෙකක් බව ය. එවිට ආත්මය යනු දෙය ම යැයි ද අපට ලිවිය හැකි ය. තවත් අතකින් බහිආත්මික වස්තුව යනු ආත්මය ම දැක්ම තුළ තමන් ම වස්තුවක් බවට පත්වීම ය.

අපගේ සත්තාව යනු අනෙකාට සම්බන්ධ, අපට ම නාඳුනන, අපට ම අයත් පිටතකින් සමන්විත යමකි. ඒ අනුව සංකේතනය තුළ පැවැත්ම - existence මෙන් ම සැබෑව තුළ ex-sistence (සංකේතනයෙන් පිටත එහෙත් ඒ තුළ ම යන අදහස) යන ද්විත්ව අර්ථය ම සත්තාව තුළ පවතියි. එවිට යථ යනු සංකේතනයෙහි බහිආත්මික සාරය යි. එමඟින් ඇතුළත හා පිටත පිළිබඳ සීමාව ප්‍රශ්නකාරී කරවන බව සඳහන් වන්නේ මේ නිසා ය. ලැකාන්ට අනුව මාගේ අභ්‍යන්තරය කුමක් නිසා හෝ පිටස්තර ය. එනම්, මාගේ ආත්මමූලිකත්වයේ මදය අනේකත්වයක් හෙළිදරව් කරයි. මෙම බහිආත්මිකතාවය හෙවත් අප තුළ තිබෙන අතිරික්තය සමාජ සබඳතා සඳහා ද ආදේශ කළ හැකි ය. නිදසුනකට අනෙකුත් අය මා පිළිබඳ ව කුමක් සිතන්නේදැයි නිශ්චිත ව මට දැන ගැනීමට නො හැකි වන්නේ මා තුළ පවතින මෙම අතිරික්තය නිසා ය. මෙම අතිරික්තය සැම විට ම මා පිළිබඳ ව අර්ථයක් ගොඩනැඟීම වළක්වයි. එමෙන්ම මෙම අතිරික්තය සමාජ සම්බන්ධතා පවත්වා ගැනීම සඳහා අනිවාර්ය සාධකයක් ලෙස ද ක්‍රියා

කරයි. එබැවින් එහි පවතින්නේ විරුද්ධාභාසයකි. මන්ද යත් අවිනිශ්චිත ලෙස හෝ අපට යම් අර්ථයක් ලැබෙන්නේ ද එම අතිරික්තය මඟින් නිසා වන බැවිනි. එවිට එක් අතකින් සමාජ සම්බන්ධතා යනු නො සම්බන්ධතා අතර සම්බන්ධතා ය. මේ අනුව අවිඥානය හා ස්වයං-විඥානය යනු එක ම පටියක (නිදසුනකට ලැකානියානු මෝබියස් පටිය) දෙපැත්ත බවට පත් වේ. එනම්, අවිඥානය හා ස්වයං-විඥානය වෙනසක් ලෙස පෙනුණ ද ව්‍යුහාත්මක ලෙස අභ්‍යන්තරික ව සම්බන්ධ වී ඇත.

චිත්‍රපට තුළ මෙම බහිආත්මිකතාවය විදේශික, වැම්පයරිකභාවයක් ලෙස මෙන් ම දැක්ම (gaze) තුළ ද පිළිබිඹු වේ. නිදසුනකට ඔලිවියර් අසායස් අධ්‍යක්ෂණය කළ "Personal Shopper" (2016) චිත්‍රපටයේ මොරීන්ට (ක්‍රිස්ටන් ස්ටුවර්ට්) දක්නට ලැබෙන හොල්මන් යනු ඇයගේ ම බහිආත්මිකතාවය භෞතික වීමකි. එමෙන් ම ඇල්ෆ්‍රඩ් හිච්කොක් අධ්‍යක්ෂණය කළ "The Birds" (1963) චිත්‍රපටයේ කුරුල්ලන් පහර දෙන කාමරය යනු බාහිර තර්ජනයට ඉඩ දෙන අභ්‍යන්තර ස්ථානයකි. එනම්, තර්ජනාත්මක පිටතෙහි සත්‍යය කේන්ද්‍රය පිහිටා තිබී ඇත්තේ නිවස තුළ ම ය. එනම්, එම චිත්‍රපටයේ බහිආත්මිකතාවය නිරූපනය වන්නේ දැක්ම තුළ ය. එවිට extimacy යනු intimacy හි ම අඩංගු වූ පැල්මක් බවට පත් වේ.

පුෂ්පජිත් නිරෝෂණ ජයසිංහ